# 9
# කල්තොට පැරණි සෙල්ලිපි

**අනූෂා වන්නිනායක**

2014 මාර්තු මස 25 දින අප්‍රේල් සිට මස 9 වන  දින දක්වාත් එම වර්ෂයේම ජූනි මස 19 දින සිට ජූනි 7 වන දින දක්වාත් අදියර දෙකක් යටතේ බලංගොඩ දිස්ත්‍රික්කයට අයත් කල්තොට කඳු පද්ධතියේ නැගෙනහිර බෑවුමේ පුරාවිද්‍යාත්මක ගවේෂණයක් සිදු කරනු ලබන්නේ කූරගල ලෙන් විහාර සංකීර්ණය හා සම්බන්ධ අනෙකුත් විහාරාරාමයන් හඳුනාගැනීම සඳහායි. එහි ප්‍රතිඵලයක් ලෙස භික්ෂූන් වහන්සේලගේ ගුහාවිහාර සහ වාසස්ථාන ලෙස භාවිත වූ ඉපැරණි ලෙන් විහාර 37 ක ප්‍රමාණයක් සවිස්තරාත්මකව වාර්තා කර තිබේ. එම ලෙන්විහාරවල ඇතැම් ඒවායේ කටාරමට යටින් කොටන ලද ශිලාලේඛන දක්නට තිබේ. ඒ අතුරින් සමහර ලිපි දැනට ප්‍රකාශයට කර තිබෙන ඒවායි. මෙම ලිපියේ දී අවධානය යොමු වන්නේ එම සෙල්ලිපිවල අන්තර්ගතය කියවා අර්ථදැක්වීම වෙත ය.

පරීක්ෂා කරන ලද කඳු බෑවුමේ කූරගල, කිරිමකුල්ගොල්ල, බුදුගල, පබ්බතාරාමය, සුදර්ශනාරාමය ආදී වශයෙන් වර්තමානයේ වෙන් වෙන්ව විහාරාරාම සංවර්ධනය වී ඇතත් ක්‍රිස්තු පූර්ව පළමුවන සහස්‍රකයේ අගභාගයේ දී එම ස්ථාන එකම ගුහාවිහාර සංකීර්ණයක් වශයෙන් පැවති බව එම ලෙන් විහාරවල පිහිටීම හා ඒවායේ සඳහන් සෙල්ලිපිවලින් මෙන්ම ඒවා අයත් කාලයෙනුත් පැහැදිලි වෙයි. කූරගල ලෙන් විහාරය හැරුණු විට අනෙක් ලෙන් විහාර සියල්ල පිහිටා තිබෙන්නේ කල්තොට කඳු බෑවුමේ නැගෙනහිර පසට වන්නට ය.

**පර්යේෂණ ඉතිහාසය**

හඳුනාගත් සෙල්ලිපි 12 අතරින් සෙල්ලිපි 8 ක් මින් පෙර ප්‍රකාශයට පත් කර තිබේ. ලිපියට අදාලවන පරිදි අංක ගත කර ඇති පහත සඳහන් ලිපි අතරින් අංක 7 හා 8 (ASCAR 1952:42, Paranavitana 1970.58, මුදියන්සේ 2000,133) අංක 1 හා 11 (ඤාණවිමල හිමි 1967.271) එමෙන්ම අංක 2, 6, 8, 10 හා 12 (මෙධානන්ද 1999.52)

ප්‍රකාශයට පත් වී ඇත. ඉහත දැක්වූ සෙල්ලිපිවලින් ඇතැම් ඒවා අසම්පූර්ණ බවින් යුතු නිසාත් ඇතැම් සෙල්ලිපි කියවීමේ දී පිටපත් ලබා නොගැනීම නිසාත් මෙම ලිපිය තුළින් ප්‍රකාශයට පත් නොකරන ලද සෙල්ලිපි සේම ප්‍රකාශයට පත්කරන ලද සෙල්ලිපි නැවත සාකච්ඡාවට ලක් කර තිබේ.

## සෙල්ලිපි

අංක 1

**පරුමක[21] උතරගුත[22] පුත පරුමක චුලහ[23] බත කශබහ[24]**

ප්‍රමුඛ උත්තරගුත්ත(ගේ) පුත්‍ර ප්‍රමුඛ චූල්ලගේ ලෙණ

අංක 2

**පරුමක රොණ[25] ඣිතය[26] පරුමක ශුදෙව[27] ඣය[28] පරුමකලු[29] රොණිය[30] ලෙණෙ[31] මහශුදශනෙ[32] නම චතුදිශ[33] ශගශ**

---

[21] සෙල්ලිපිවල නාමවිශේෂණ පදයක් ලෙස නිරන්තරයෙන් යෙදේ. සංස්කෘතයේ 'ප්‍රමුඛ' යන පදයෙන් සැදුනකි. එය පාලි භාෂාවේ දී 'පාමොක්ඛ' යනුවෙන් යෙදේ. සංස්කෘතයේ මෙන්ම පාලියේ යෙදෙන මෙම වචන ද්වයෙන්ම අදහස් කරන්නේ 'ප්‍රධානියා' යන්නයි. කාව්‍ය සාහිතයේ එය යෙදී තිබෙන්නේ අවංක, උදාර යන අර්ථ වලිනි. මජ්ජිම නිකායේ එය නායකයා යන අරුතින් යෙදී තිබේ. මෙම සෙල්ලිපියේ යෙදී තිබෙන 'පරුමක' යන පුරුෂලිංග ඒකවචන පදයෙන් 'ප්‍රධානියා' යන අදහස ඉදිරිපත් කරන්නට ඇත.

[22] මෙහි සංඥා නාමයක් ලෙස යෙදී ඇති 'උතරගුත' සංස්කෘතයේ හා පාලියේ යෙදෙන 'උත්තර' හා 'ගුප්ත' යන වචන සංයෝග වීමෙන් සැදුනකි. එළු භාෂාවේ දී 'උතර' යන්න යෙදෙන්නේ 'උතුරු' යනුවෙනි. සංස්කෘතයේ මෙන්ම පාලියේත් 'උත්තර' යන පදයේ දී තිබෙන්නේ උත්තරීතර ඒසේත් නැතිනම් තත්වයෙන් වඩා උසස් යන අරුතිනි. ඇතැම් ස්ථාන වල ඉහළින් පිහිටි යන අර්ථයෙන් ද යෙදී ඇත. නාමවිශේෂණ පදයක් ලෙස සෙල්ලිපිවල බොහෝ අවස්ථාවල යෙදී ඇත. 'ගුත' යන පදය සංස්කෘතයේ 'ගුප්ත' යනුවෙනුත් පාලියේ 'ගුත්ත' යනුවෙනුත් යෙදේ. සංස්කෘත භාෂාවේ මෙන්ම පාලි භාෂාවේත් එය යෙදෙන්නේ 'ආරක්ෂා කරන්නා, රැකබලාගන්නා' යන අරුත් ඇතිවය. ඇතැම් ස්ථානවල ස්වදේශ කර්මාන්ත දියුණු කරන්නා යන අදහසින් ද යෙදී තිබේ. ඒ අනුව සෙල්ලිපියේ යෙදී ඇති 'උතරගුත' යන පුරුෂලිංග ඒකවචන පදයෙන් උතුරු ප්‍රදේශය ආරක්ෂා කරන්නා යන අදහස ඇතිව සංඥා නාමයක් ලෙස යෙදෙන්නට ඇත.

[23] මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් සෙල්ලිපියේ ඉදිරියේ දී සාගච්ඡා කර ඇත.

[24] මෙම ලිපියේ දැක්වෙන 'කශබ' යන සංඥානාමය සංස්කෘතයේ 'කාශ්‍යප' යන්නෙන් සකස් වූවකි. එය පාලියේ 'කස්සප' වශයෙනුත් එළු බසෙහි 'කසුබ' යනුවෙනුත් යෙදේ. සෙල්ලිපියේ දැක්වෙන 'කශබ' යන්නට 'හ' ප්‍රත්‍ය එකතු වී සම්බන්ධ විභක්තියේ වර නැගී ඇත.

[25] මෙම ලිපියේ යෙදී ඇති 'රොණ' යන සංඥානාමය සංස්කෘතයේ හා පාලියේ යෙදී ඇති 'රෝහණ' යන්නෙන් සකස් වූවකි. සංස්කෘතයේ මෙය කන්දක් හැඳින්වීම සඳහා සංඥානාමයක් ලෙස යෙදී ඇත. විමාන වත්තුවේ 'රෝහණ' නමින් හැඳින් වූ ගෘහ මූලිකයෙක් ගැන සඳහන් වේ. මනොරත පුරණියේ හා අංගුත්තර නිකායේ 'රෝහණ' නමින් හඳුන්වා තිබෙන්නේ 'මිගාර' නම් පුද්ගලයාගේ සීයායි. අංගුත්තර නිකායේ ලිච්ඡවීන්ගේ යහළුවෙක් 'රෝහණ' ලෙස සඳහන් කර ඇත. මහාවංශයේ 'රෝහණ' නමින් හැඳින් වූ ශාක්‍ය කුමාරයෙක් ගැන සඳහන් කරයි. ඔහු භද්දකච්චායනා කුමාරියගේ සොහොයුරෙකි. ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ දී දේශපාලණික වශයෙන් බෙදා තිබූ කොටස්වලින් එකක් හැඳින්වූයේ 'රෝහණය' යනුවෙනි. මහාවංශයේ තවත් තැනෙක 'රෝහණ' නම් ගම් ප්‍රධානියෙක් ගැන සඳහන් කරයි. ඔහු කිත්ති නම් ගමේ ගම් ප්‍රධානියායි.

[26] බ්‍රාහ්මීය ශිලාලිපිවල යෙදෙන 'ඣිත' යන්න සංස්කෘතයේ 'දුහිතෘ' යන පදයෙන් සකස් වී ඇත. පාලි භාෂාවේ එය 'ධීතා' යනුවෙන් ද එළු භාෂාවේ 'දූ' යනුවෙන් ද ශබ්දවන මෙම පදයෙන් අර්ථගැන්වෙන්නේ 'දියණිය' යන්නයි. එය සම්බන්ධ විභක්තියේ වර නැගීමේදී 'ය' ප්‍රත්‍ය යොදා ඇත. 'ඣිත' යන පදය ආකාර දෙකකට ව්‍යුත්පන්න විය හැකිය. එහි අනෙක් අරථය වන්නේ

ප්‍රමුඛ රෝහණ(ගේ) දුව (වූ ද) ප්‍රමුඛ සුදේව (ගේ) බිරිඳ (වූ) රොණිය ප්‍රමුඛාවිය (ගේ) මහා සුදර්ශන නම් ලෙන සතර දිශාවෙන් පැමිණි සංඝයාට

අංක 3

**අශදෙව[34] පුත ශිතදෙව[35] පටිබන කුටෙ[36] අගත[37] අනගත චතුදිශ ශගශ දිනෙ**

---

'අපරාජිත' යන්නයි. මෙය සංඥානාමයක් ලෙස නාමල්පොකුණ සෙල්ලිපියේ යෙදී ඇත (අශ ඣිතහ ලෙණෙ ශගශ......)(CALR II.79).

[27] සෙල්ලිපියේ සංඥානාමයක් ලෙස යෙදී ඇති 'ශුදෙව' යන්න සංස්කෘත භාෂාවේ 'සුදේව' යන පදයෙන් සකස් වූවකි. 'දේව' යන පදයේ අර්ථය වැඩි කිරීමට 'සු' යොදා ඇත. සංස්කෘතයේ යෙදෙන සුදේව යන පදයෙන් යහපත් වූ දෙවියා යන අර්ථය දෙයි. පාලි සාහිත්‍යයේ ජාතක කථාවේ හා බුද්ධවංශයේ මංගල බුදුන්ගේ අග්‍රශ්‍රාවකයා හඳුන්වා ඇත්තේ ද 'සුදේව' යනුවෙනි. එහිම සුජාත බුදුන්ගේ අග්‍රශ්‍රාවකා ද 'සුදේව' නමින් හඳුන්වා තිබේ. මෙම සෙල්ලිපියෙහි 'ශුදෙව' යන්න පුරුෂලිංග ඒකවචන පදයක් ලෙස යෙදී ඇත.

[28] මෙය සංස්කෘත භාෂාවේ 'ජායා' යන ස්ත්‍රීවාචී පදයෙන් භින්න වූවකි. එය එළු භාෂාවේ 'දැ' ලෙස යෙදේ. මෙයින් 'බිරිඳ' යන අර්ථය ලබා දෙයි.

[29] 'පරුමක' යන පදයේ ස්ත්‍රීවාචී පදය වන 'පරුමකලු' ඇතැම් සෙල්ලිපිවල 'පරුමකලී' එසේත් නැතිනම් 'පරුමකල' වශයෙන් යෙදී ඇත. රිටිගල මක්කල උල්පොත ලිපියෙහි '-----පරුමක නගුලි ඣිත පරුමකලු දී(පානී) ය-----'(Paranavitana 1970.260). මැදගම විහාර ලිපියෙහි එය '------නාඝ තිශහ බරිය පරුමකලී හුම(න)ය---(එම).

[30] 'රොණිය' යන්න ස්ත්‍රීවාචී සංඥානාමයක් ලෙස යෙදී ඇත. එය සංස්කෘත භාෂාවේ 'රොහිණී' යන පදයෙන් සකස් වූවකි. මිහින්තලයේ අංක 10 දරන සෙල්ලිපියේ උපාසක මහානාගගේ දියණිය හඳුන්වා ඇත්තේ 'උපාසිකා රොණිය' යනුවෙනි (Paranavitana 1970.260). බ්‍රාහ්මණයාගම සෙල්ලිපිවල පරුම නදිකගේ දියණිය මෙන්ම පරුමක සෝනගේ භාර්යාව හඳුන්වා ඇත්තේ ද 'රොණිය' යනුවෙනි. ඇය උපාසිකාවකි (එම 156). අතීත ඉන්දියාවේ ශාක්‍ය හා කෝලිය යන ජනපද දෙක වෙන්කල කුඩා ගඟක් 'රෝහිණී' යනුවෙන් හඳුන්වයි. එමෙන්ම ථෙරගාථා අටුවාවේ පච්චායන ථෙර උපන් ගම හඳුන්වා ඇත්තේ ද මෙනමිනි.

[31] මෙම පදය සංස්කෘතයේ 'ලයන' යන වචනයෙන් සකස් වූවකි. එය පාලි භාෂාවේ යෙදෙන්නේ 'ලෙණ' යනුවෙනි. භික්ෂූන්වහන්සේලාගේ කුටි එසේත් නැතිනම් ගුහා යන අර්ථයෙන් විනය පිටකයේත්, මිලින්ද ප්‍රශ්නය, විභංග සූත්‍රය යන ස්ථානවල යෙදී තිබේ. විනය පිටකයේ භික්ෂූන්වහන්සේලා සඳහා බුදුන්වහන්සේ විසින් අනුදැන වදාල ආරාම අතරට 'ගුහා' ද ඇතුලත් වෙයි.

[32] ප්‍රථමා විභක්ති ඒකවචන පදයකි. පාලි භාෂාවේ එන 'මහාසුදස්සන' යන පදයෙන් සකස් වන්නට ඇත. එයින් 'මනා පෙනුමක් ඇති' යන අර්ථය ලබා දෙයි. ලිපියේ 'මහශුදසන' යන පදය ස්ථාන නාමයක් ලෙස යෙදී ඇති අතර 'එ' ප්‍රත්‍ය යෙදෙමින් සම්බන්ධ විභක්තියේ වර නගා ඇත.

[33] පාලියේ 'චතු' ලෙසත් සංස්කෘත භාෂාවේ 'චතුෂ්' ලෙසත් එළු බසෙහි 'සිව්' ලෙසත් යෙදී ඇති මෙයින් 'හතර' යන සංඛ්‍යාවාචී පදය දක්වයි. 'දිශා' යන ශබ්ද ප්‍රකෘතිය සංස්කෘත භාෂාවේ 'දිශා' යන්නෙන් සකස් වූවකි. එය පාලි භාෂාවේ දී 'දිසා' ලෙස ශබ්ද වේ. එළු බසෙහි ශබ්ද වන්නේ 'දෙස' යනුවෙනි. මහාභාරතයේ 'දිශා' යන්න ප්‍රදේශය, දිශාව යන අර්ථයෙන් යෙදී ඇත. පාලි 'දිසා' යන පදය දිශාව යන අර්ථයෙන් චුල්ලනිද්දේශයේ, පේතවත්තුවේ හා සංයුත්ත නිකායේ යෙදී ඇත. ඒ අනුව 'චතුදිශ' යන පදයෙන් 'සතර දිශාව' යන අර්ථය ලබා දෙයි.

[34] සෙල්ලිපියේ සංඥානාමයක් ලෙස යෙදී ඇති මෙම පදය සංස්කෘතයේ 'ආයුෂ්ය' හා 'දේව' යන පද දෙක සමාස වීමෙන් සෑදුනකි. සංස්කෘත භාෂාවේ 'ආයුෂ්ය' යන පදය පාලි භාෂාවේ 'ආයස්මා' ලෙස යෙදේ. සංස්කෘත හා පාලි භාෂාවේ යෙදෙන මෙම පද දෙකෙන් අදහස් කරන්නේ 'දීර්ඝායුෂ' යන්නයි. බහුල වශයෙන් ගෞරවාචී නාම පදයක් ලෙස පොදු නාමයන්ට ඉදිරියෙන් යෙදී ඇත. බොහෝ ස්ථාන වල එය යෙදී ඇත්තේ භික්ෂූන්වහන්සේලාගේ නාමයට ඉදිරියෙනි. 'දෙව' යන්න සංස්කෘත භාෂාවේ 'දේව' යන පදයෙන් සෑදුනකි. එයින් 'දෙවියන්' යන අර්ථය ලබාදෙයි. බුද්ධවංශ අටුවාවේ සුජාත බුදුන්ගේ අග්‍රශ්‍රාවනකයා 'දේව' නමින් හඳුන්වා ඇත. කප්පුක නම් ගමේ විසූ භික්ෂූන්වහන්සේ නමක් ද 'දේව' නමින් හඳුන්වා ඇති බව මහාවංශයේ හා දීපවංශයේ සඳහන් වෙයි. චූලවංශයේ කිත්සිරිමේඝ රජුගේ සේනාධිපතියෙක් 'දේව' නමින් හඳුන්වා ඇත.

අශ්වදේව(ගේ) පුත් ශීතදේවගේ පටිහාන කුටියසතර දිගින් පැමිණියා වූ ද නොපැමිණියා වූ ද සංඝයාට දිණි

අංක 4

**උපශක[38] ස - - - - - තිශ[39] ශගශ**

උපාසක ස - - - - තිස්ස සංඝයා (ට)

අංක 5

**උපශක දීගතිශ[40] - - - - (ශගශ)**

උපාසක දීඝතිස්ස - - - - - - සංඝයාට

අංක 6

**පරුමක ශොමදෙවය[41] ලෙණෙ අගත අනගත චතුදිශ**

---

[35]'ශිතදෙව' යන පදය සංඥනාමයක් ලෙස සෙල්ලිපියේ යෙදේ. මෙහි 'ශිත' යන්න නාම විශේෂණ පදයකි. එය සංස්කෘත භාෂාවේ 'ශීත' යන පදයෙන් සකස් වූවකි. පාලි භාෂාවේ එය යෙදෙන්නේ ද 'ශීත' යනුවෙනි. එයින් සිසිල, සීතල යන අරුත් දනවයි.

[36]'පටිබන' යන්න සංස්කෘත භාෂාවේ 'ප්‍රතිභාන' යන්නෙන් සකස් වූවකි. එය පාලියෙහි 'පටිභාන' යනුවෙන් සඳහන් වේ. කුටිය යන පදයට විශේෂණ පදයක් ලෙස සෙල්ලිපියේ යෙදී ඇත. පිරිසිදු භාවයට පැමිණි එසේත් නැතිනම් සහජඥානය නිර්මාණශීලීත්වයයන අරුතින් සංස්කෘත භාෂාවේ එය යෙදෙයි. ලලිතවිස්තරයේ එය ව්‍යක්තභාවයට පැමිණි යන අරුතින් යොදා ඇත. පාලි භාෂාවේදී 'ප්‍රටිභාන' යන්න තේරුම්ගැනීම, ඥානය, ප්‍රදීපාලෝකය යන අරුත්වලින් යොදා ඇත. අප්‍රමාදය, බුද්ධිය යන අදහසින් දීඝනිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය හා විභංග සූත්‍රයේ යොදා ඇත.

[37] අතීත ක්‍රියාවක් දක්වන පදයකි. සංස්කෘත භාෂාවේ යෙදෙන 'ආගත' යන්නෙන් සකස් වූවකි. පාලිභාෂාවේ එය ශබ්ද වන්නේ ද සංස්කෘතයේ ශබ්ද වන ආකාරයෙනි. සෙල්ලිපිවල යෙදීමේ දී එය 'අනගත චතුදිශ' යන පදයන් සමග නිරන්තරයෙන් එක්ව යෙදේ. එය පාලියේ එන 'ආගතානාගතස්ස චාතුද්දිසස්ස සංඝස්ස' යන යෙදීමට සමාන වේ. සංස්කෘත භාෂාවේ 'ආගත' යනුවෙන් පැමිණියා වූ නැතිනම් ලගා වූ යන අරුතින් යෙදේ. මෙහි අනාගත ක්‍රියා රූපය වන්නේ 'අනගත' යන යෙදුමයි.

[38]නාම විශේෂණයක් ලෙස සෙල්ලිපියේ යෙදී ඇති 'උපශක' යන්න සංස්කෘත භාෂාවේ 'උපාසක' යන්නේ සැදුනකි. එය පාලි භාෂාවේ දී ශබ්ද වන්නේ ද සංස්කෘත භාෂාවේ ශබ්ද වන ආකාරයෙන්මය. පුරුෂලිංග ඒකවචන පදයක් වන උපශක යන්නෙන් බෞද්ධ බැතිමතා හඳුන්වයි. බුද්ධශාසනය තුළ සිව්වනක් පිරිසෙන් එක් පිරිසක් ලෙස 'උපාසක' පිරිස හඳුන්වා ඇත.

[39]සෙල්ලිපියේ සංඥනාමයක් ලෙස යෙදෙන 'තිශ' යන්න පුරුෂවාචී පදයකි. එය සංස්කෘත භාෂාවේ 'තිශ්‍ය' යන පදයෙන් සකස් වූවකි. පාලියේ 'තිස්ස' ලෙසත් එළු භාෂාවේ 'තිස්' ලෙසත් යෙදේ. සංස්කෘත භාෂාවේ දී තාරකා රාශියක් හැඳින්වීම සඳහා 'තිශ්‍ය' යන නම යොදා තිබේ. පාලි සාහිත්‍යයේ එය සංඥනාමයක් ලෙස යෙදුනු අවස්ථා කිහිපයක් හමුවේ. 'තිස්ස' නමින් හැඳින් වූ අයෙක් විපස්සී බුදුන්ගේ අගසව් දෙනම අතර සිටි බව බුද්ධවංශයේ මෙන්ම දීඝ නිකායේ සඳහන් කරයි. එමෙන්ම දීපංකර බුදුන්ගේ අගසව් දෙනමගෙන් එක් අයෙකු 'තිස්ස' නමින් හැඳින්වූ බව බුද්ධවංශයේ හා මහාබෝධිවංශයේ සඳහන් කරයි. මේ ආකාරයට පාලි සාහිත්‍යයේ ස්ථාන ගණනාවකම 'තිස්ස' යන්න සංඥනාමයක් ලෙස යොදා තිබේ.

[40]සංඥනාමයක් ලෙස යෙදී ඇත. පාලියෙහි 'දීඝ තිස්ස' යන්නෙන් සැදුනකි.

[41]සංස්කෘත භාෂාවේ හා පාලි භාෂාවේ යෙදෙන 'සෝමදේව' යන පදයෙන් සැදුන සංඥනාමයක් ලෙස සෙල්ලිපියේ යෙදී ඇත. පුරුෂලිංග ඒකවචන නාමපදයක් ලෙස යෙදී ඇති මෙම පදය 'ය' ප්‍රත්‍යය යෙදීමෙන් සම්බන්ධ විභක්තියේ වර නගා ඇත. ආපදානයේ හා ථෙරගාථා අටුවාවේ නවවැනි කප්පස් රජුට පෙර සිටි 85 වැනි රජුගේ නම සෝමදේව නමින් සඳහන් කර ඇත. කෝණාගම බුදුන්ගේ ප්‍රධාන ගිහි අනුග්‍රහකයන්ගෙන් එක් අයෙක් ද මේ නමින් හඳුන්වා ඇති බව බුද්ධවංශයේ පැහැදිලි කරයි.

ප්‍රමුඛ සෝමදේවගේ ලෙන සතරදිගින් පැමිණියා වූ ද නොපැමිණියා වූ ද සංඝයාට

අංක 7

**උපශොණ[42] අපි[43] අය[44] කෙර[45]- පුත අය මහ ශිවහ[46] ලෙණෙ මනපදශනෙ චතුදිශ ශගශ දිනෙ**

උපසෝන වැව කෙර කුමාරයාගේ පුත් මහාශිව කුමාරයාගේ මනාපදස්සන ලෙන සතර දිශාවේ සංඝයාට දුන්නා

අංක 8

**තිශ රකිත[47] තෙරහ මහලෙණෙඅපරිමිත[48] ලොකධතුය[49] අගත අනගත චතුදිශ ශගශ**

තිෂ්‍ය රක්ෂිත තෙරුන්ගේ මහාලෙන අප්‍රමාන ලෝක ධාතුවෙන් පැමිණියා වූත් නොපැමිණියාවූත් සංඝයාට

අංක 9

**ණෙලෙ හශති කමරුප**

---

[42]ස්ථානවාචී නාමපදයක් ලෙස යෙදී ඇති මෙය සංස්කෘතයේ 'උපශෝන' යන්නෙන් සකස්වන්නට ඇත. සෙල්ලිපියේ සඳහන්වන 'උපශෝන අපි' යන්න පාලියෙහි 'උපහෝන වාපී' ලෙස සඳහන් වේ.

[43]සෙල්ලිපියේ යෙදී ඇති 'අපි' යන පදය සංස්කෘතයේ 'වාපි' යන්නෙන් සෑදුනකි. එය පාලියේ ශබ්ද වන්නේ සංස්කෘතයේ ශබ්ද වන ආකාරයෙනි. සංස්කෘත භාෂාවේ ස්ත්‍රීවාචී නාමපදයක් ලෙස යෙදී ඇත. සංස්කෘතයේ මෙන්ම පාලියේ යෙදෙන 'වාපි' යන්නෙන් 'වැව' යන අදහස ලබාදෙයි.

[44]මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් ලිපියේ ඉදිරියේ දී සාගච්ඡා කර ඇත.

[45]ලිපියේ සංඥනාමයක් ලෙස 'කෙර' යන්න යෙදී ඇත. සංස්කෘත භාෂාවේ 'කේරල' යන පදය රටක් හා එහි වැසියන් හැඳින්වීමට යොදාගෙන ඇත.

[46]සංඥනාමයක් ලෙස යෙදී ඇති 'මහශිව' යන්න සංස්කෘත භාෂාවේ 'මහාශිව' ලෙසත් පාලි භාෂාවේ 'මහාසිව' ලෙසත් යෙදී ඇත. මෙහි 'මහා' යන්න නාම විශේෂණ පදයක් ලෙස යෙදී ඇත. ජාතක කථා සාහිත්‍යයේ 'මහාසිව' යන නමින් වාමන්තපබ්භාරයෙහි වාසය කල හිමි නමක් හඳුන්වා තිබේ.

[47] 'රකිත' යන්න සංස්කෘත භාෂාවේ යෙදෙන 'රක්ෂිත' යන පදයෙන් සෑදුම් ලද්දක් විය යුතුය. එය පාලි භාෂාවේ දී 'රක්ඛිත' යනුවෙන් ශබ්ද වෙයි. ඍග්වේදයේ 'රක්ෂිත' යන්න ආරක්ෂාකල, නඩත්තුකල යන අරුතින් යෙදී තිබේ. සාස්සෘත 'රක්ෂිත' යන්න වෛයාචාර්යවරයකුගේ නමක් ලෙස යොදා තිබේ. සිද්ධාන්ත කුමුදුනී 'රක්ෂිත' යන්න ව්‍යකරණඥයකුගේ නමක් ලෙස යොදා තිබේ. පාලි භාෂාවේ යෙදී තිබෙන්නෙ ද සංස්කෘතයේ යෙදි ඇති අර්ථයන් දැක්වීම සඳහායි. පාලි සාහිත්‍යයේ ථෙරගාථාවේ හා ආපදානපාලියේ භික්ෂුන්වහන්සේගේ නමක් ලෙස 'රක්ඛිත' යොදා තිබේ. ඔහු ශාක්‍ය වංශයේ උපන් කුමාරයෙකි. ලොඛිතා හා මොග්ගල්ලාන රජුගේ පුත්‍රයෙකු මේ නමින් හඳුන්වා ඇති බව චූලවංශයේ දැක්වේ. ඔහු i විජයබාහුගේ සහෝදරයෙකි.

[48]මෙම පදය සංස්කෘත භාෂාවෙන් 'තත්සම' වූ පදයකි. සීමාවක් නොමැති එසේත් නැතිනම් අප්‍රමාණ වූ යන අදහස මෙයින් ගම්‍ය වේ.

[49]ලෝකධාතුව යනුවෙන් මෙහි අදහස් කර තිබෙන්නේ සමස්ත විශ්වයයි. බෞද්ධ විශ්වයට ඉතා පුළුල් අවකාශීය පරාසයක් අයත් වේ. එය ඉහලෝක (අයංලොක) සහ පාරලෝක (පාරෝලෝක) වශයෙන් බෙදේ. මෙම සමස්ත විශ්වය ලෝක වශයෙන් 7 කට හා ඇතැම් තැනක 14 කට බෙදා තිබේ.

පරුමක තිශගේ ලෙණ

අංක 10

**බත ශොනහ**

ශ්‍රේෂ්ඨ සෝනගේ

අංක 11

**පරුමක ශොන පුතහ බත පුනශ ගුතශ**

ප්‍රමුඛ සෝනගේ පුත් ශ්‍රේෂ්ඨ පුනශ ගුප්ත

අංක 12

**උපශොන අය තිශ පුත අය කෙරශ පුතශ අය මහතිශ ලෙණෙ ශුපදිනෙ[50] චතුදිශ ශගශ**

තිස්ස කුමාරයාගේ පුත් කෙරශ කුමාරයාගේ පුත් මහාතිස්ස කුමාරයාගේ ශුපදිනෙ (මනාවපිහිටි) ලෙන සංඝයාට

## සෙල්ලිපිවල අන්තර්ගතය

ගවේෂණය මගින් හමු වූ සියළුම ශිලාලිපි ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසටත් පළමුවන සියවසටත් ඇතුළත් කළ හැකිවෙයි. ස්වභාවයෙන්ම මෙම යුගයේ ගුහා ලිපි කෙටි රචනා ය. එසේ වන්නට ඇත්තේ මෙම රචනාවන්හි ප්‍රධාන පරමාර්ථය ඒවා භික්ෂූන්වහන්සේලා සඳහා පූජා කළ බව දැක්වීම පමණක් වීමයි. එහෙත් එම ගුහාවන් සකස්කර පූජා කළ පුද්ගලයන්ගේ නම් හා වෘත්තීන් මෙන්ම ඇතැම් අවස්ථාවන්හි දී ඔවුන්ගේ අනන්‍යතාව දක්වා තිබීමෙන් සමකාලීන සමාජය පිළිබඳව අසම්පූර්ණ එහෙත් වැදගත් දැනුමක් ගොඩනගා ගැනීමට හැකියාව ලැබේ.

ගුහා පූජාවන්හි දී ඒ සඳහා දායකත්වය දැක්වීමට නිරන්තරයෙන් පෙළඹී තිබෙන්නේ සමාජයේ යම් කිසි ආර්ථික මට්ටමක් අත්පත් කර ගෙන සිටි පිරිස් බව ලංකාව පුරා විසිරී ඇති සෙල්ලිපිවලින් පැහැදිලි වෙයි. එම තත්ත්වය අපගේ ගවේෂණ කලාපයට ද අදාල වී ඇති බව සෙල්ලිපිවල ඇතුළත් තොරතුරු මගින් පැහැදිලි වේ. ගුහාවිහාර සකස් කිරීම සඳහා සාමාන්‍ය ජනයාගේ දායකත්වය ලබාගන්නට ඇති වුවත් ඔවුන්ගේ තොරතුරක් සෙල්ලිපි තුළ ඇතුළත් නොවෙයි. නමුත් මෙම කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට ගවේෂණයෙන් හමු වූ එක් සෙල්ලිපියක් ඉතා වැදගත් වෙයි. ඒ මෙහි දැක්වූ අංක 12 දරණ සෙල්ලිපියයි.

---

[50]ස්ථාන නාමයක් ලෙස යෙදී ඇත. සංස්කෘතයේ 'සුප්‍රතිෂ්ඨිත' යන පදයෙන් සැදුනකි. පාලියේ එය 'සුප්පතිට්ඨ' ලෙස ශබ්ද වේ. මනාව පිහිටි යන අදහස මෙයින් ගම්‍ය වේ.

සෙල්ලිපියේ දැක්වෙන පරිදි මෙම ගුහාව පූජාකර තිබෙන්නේ මහශිව නම් කුමාරයෙකි. ඔහුගේ අනන්‍යතාව දැක්වීමේ දී ඔහුගේ පියා මෙන්ම සීයා ද 'අය' යනුවෙන් හඳුන්වා තිබේ. මෙම අය යනුවෙන් සෙල්ලිපිවල හැඳින් වූ පුද්ගලයන් එකල සමාජයේ කිසියම් වූ ආකාරයක දේශපාලන බලයක් හිමිකරගෙන සිටි පිරිසක් බව විද්වතුන්ගේ අදහසයි. මෙහිදී වැදගත් වන්නේ මෙම කුමාරවරුන් අතර තවත් එක් පිරිසක් පිළිබඳ සඳහන් වීම ය. සෙල්ලිපියේ ප්‍රධාන අක්ෂර පේළි 2කට යටින් එම අක්ෂරවලට බෙහෙවින් කුඩා ප්‍රමාණයේ අක්ෂරවලින් 'යගශ' යනුවෙන් සඳහන් වී තිබීමයි. සෙල්ලිපියේ ප්‍රධාන අක්ෂරවලට වඩා ප්‍රමාණයෙන් කුඩාවට සෙල්ලිපියේ පහළින්ම මෙලෙස යෙදුමක් ඇතුලත් කරන්නට හේතු වූයේ කුමන කරුණක් ද යන්න සලකා බැලිය යුතු වේ.

සෙල්ලිපි ලිවීමේ දී ඒවා ලිවීමට අනුග්‍රහය දැක්වූ පුද්ගලයන් විසින් ම ඒවා ලියන්නට ඇති බව සිතිය හැකි නොවේ. ඇතැම්විට ඔවුන්ගේ අනුදැනුම ඇතිව ගල්වඩුවන් විසින් ඒවා ගල් මත පිටපත් කරන්නට ඇත. 'යගශ' යනුවෙන් ඉතා කුඩා අකුරුවලින් සෙල්ලිපියේ ප්‍රධාන පෙළින් වෙන්ව යොදන ලද්දේ මෙම ගල් වඩුවන්ගේ පරපුර පිළිබඳ විය යුතු ය. ඇතැම් විට මෙම පරම්පරාව ඓතිහාසික ග්‍රන්ථවල සඳහන් කරන්නට යෙදුන 'යක්ෂ' නමින් හැඳින් වූ ජනකොට්ඨාශය වන්නට ඉඩ ඇත. සිංහල භාෂා පරිණාමයේ දී 'ග' අක්ෂරය 'ක' අක්ෂරය බවට පත් වූ හෙයින් 'යගශ' යන්න 'යකෂ' ලෙස ශබ්දවන්නට ඇත. ක්‍රිස්තු පූර්ව 3 වන සියවසේ දී විජය කුමරු ඇතුළු පිරිස මෙරටට පැමිණෙන විට 'යක්ෂ' නමින් ජන කොට්ඨාශයක් මෙරට ජීවත් වූ බව වංශකථා සඳහන් කරයි (මහාවංශය 1996.23-33). එමෙන්ම මෙම සෙල්ලිපි දක්නට ලැබෙන ගුහා පිහිටි පර්වතය අතීතයේ 'තණ්ඩුලෙය්‍යක පබ්බත' යනුවෙන් හැඳින් වූ බවත් එසේ හඳුන්වනනට පදනම් වූයේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ බලකොටුවක් මෙහි පැවති සමයෙහි මෙම පර්වත පාදයෙහි පිහිටි වී අමුණු දහස් ගණනක් විශාල කාලතිත්ත වෙල්යාය මේ පර්වතවාසීන් සතුව නිසා බවත් ජනප්‍රවාදයේ සඳහන් වෙයි (ඥානවිමල හිමි 1967.265).

සෙල්ලිපි අතරින් අංක 3, 6 යන සෙල්ලිපිවල යෙදී ඇති සංඥානාම වන අශදෙව, ශිතදෙව, සොමදෙව යන සියල්ල අවසන් වන්නේ දේව යන නමිනි. මෙහි දැක්වෙන අශ, ශිත, සොම යන්න ඔවුන්ගේ පෞද්ගලික නාමය විය යුතු ය. ශිතදේවගේ පියා අශදෙව වෙයි. එසේ නම් මොවුන් දෙදෙනාගේම පෞද්ගලික නාමයට ඉදිරියෙන් 'දෙව' යනුවෙන් යොදා ඇත්තේ එය ඔවුන්ගේ පරම්පරා නාමය හේතුවෙන් වන්නට ඇතැයි සිතිය හැකිවෙයි. මෙහි 'සොමදෙව' යන සංඥානාමය වෙනත් ගුහා ලිපියන සඳහන් වූවත් එකම ප්‍රදේශයේ පිහිටි ගුහා සංකීර්ණයට ඇතුලත් වෙයි. ඔවුන් ඇතැම් විට එකම ජන පිරිසකට අයත් වූවන් වීමට ඉඩ ඇත.

මහාවංශයේ සඳහනට අනුව පූර්ව ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ වාසය කළ ප්‍රධාන ජන කොට්ඨාශ අතරින් එක් පිරිසක් ලෙස 'දේව' යන ජනකොට්ඨාශය හඳුන්වා තිබේ. මේ අනුව සෙල්ලිපි හා බැඳුණු සමකාලීන සමාජයේ 'යක්ෂ' හා 'දේව' යන ජනකොට්ඨාශයන් වාසය කරන්නට ඇති බව සිතිය හැකි වේ. මේ ජන කොට්ඨාශ දෙක අතරින් 'දේව' යනුවෙන් හඳින් වූ ජනකොට්ඨාශය සමාජයේ ප්‍රභූ පැලැන්තියට ඇතුලත් වූ පිරිසක් බව ඔවුන්ගේ අනුග්‍රහය මත ලෙන් පූජා කිරීමෙන් පැහැදිලි වෙයි.

අප හමුවේ ඇති සෙල්ලිපි තුළින් ප්‍රදේශයේ දේශපාලන ඉතිහාසය පිළිබඳ තොරතුරක් ලබාගැනීම ඉතා දුෂ්කර වේ. හමු වී ඇති සියළු සෙල්ලිපි බ්‍රාහ්මී යුගයට අයත් වන අතර ඉන්පපසු ඉතිහාසගත කරුණු ඉදිරිපත් කරන සෙල්ලිපි නොමැති වීම ඒ සඳහා බලපාන ප්‍රධාන බාධාවයි. නමුත් හමු වී ඇති ගුහා ලිපි විමසීමේ දී දේශපාලනික වශයෙන් සම්බන්ධ තනතුරු දෙකක් හඳුනාගත හැකි වෙයි. ඒ පරුමක හා අය යන තනතුරුයි. ඉහත සඳහන් අංක 1 දරණ ලිපියේ 'උතරගුත' පරුමක තනතුර දරුවකු වන අතර ඔහුගේ පුත් 'චූල' ද එම තනතුරට හිමිකම් කීය. එමෙන්ම අංක 2 දරණ සෙල්ලිපියේ 'රොණ' හා ඔහුගේ බෑනා වන 'ශුදෙව' යන දෙදෙනාම පරුමක තනතුර දරුවන්ය. අංක 6 දරණ සෙල්ලිපියේ පරුමක 'ශොමදෙව' නම් පුද්ගලයකු ගැන සඳහන් කරයි. පරුමක 'ශොන' නම් පුදගලයකු පිළිබඳ අංක 11 දරන සෙල්ලිපියෙහි සඳහන් කර ඇත. ලංකාවේ හමුවන මූල බ්‍රාහ්මී සෙල්ලිපි අතර පරුමක යන තනතුරු නාමයට මුලින් ඔහුගේ රැකියාව පිළිබඳ සඳහන් කර ඇති නමුත් අපගේ අවධානයට ලක් වූ කිසිදු සෙල්ලිපියක ඔවුන්ගේ තනතුරක් පිළිබඳ සඳහන් කිරීමක් නොමැත.

මූල බ්‍රාහ්මීය සෙල්ලිපිවල සඳහන් මෙම පරුමකවරුන්ගේ සමාජ දේශපාලන පිළිඹිබුව පිළිබඳ නොයෙකුත් විද්වතුන් තම අදහස් විවිධ ආකාරයෙන් දක්වා තිබේ (Paranavitana 1970, එල්ලාවල 2002, මුදියන්සේ 2000). පොදුවේ ගත් කළ මෙම අදහස් වලින් පැහැදිලි වන්නේ පාලන බලය අතින් පූර්ව රාජ්‍ය අවධියේ ප්‍රමුඛත්වයක් දරූ පිරිසක් මෙන්ම ආර්ථික බලයක් හිමි සමාජයේ යම් පිරිසකට නායකත්වය දුන් පිරිසක් ලෙස 'පරුමක' වරුන් හඳුනාගත හැකි බවයි.

පාලන බලය හා සම්බන්ධ තවත් පිරිසක් ලෙස මෙම සෙල්ලිපිවල දක්වෙන 'අය' යන තනතුරු නාමය භාවිතා කල පිරිස හඳුනාගත හැකිවෙයි. මෙම සෙල්ලිපි අතර 'අය' වශයෙන් හැඳින්වූ පුද්ගලයන් තිදෙනෙක් හඳුනාගත හැකිය. ඒ අය තිශ, අය කෙර හා අය මහශිව යි. මොවුහු පියපුතුවරුන් වෙති. සෙල්ලිපිවල සඳහන් මෙම 'අය' යන්න සංස්කෘතියේ 'ආර්ය' යන්නෙන් බිඳුනක් බව විද්වතුන් සඳහන් කරයි (Paranavitana 1970 ixvi). ආර්ය යන සංස්කෘත වචනයේ පාලි

රූපය 'අය්ය' නොව 'අරිය' බවත් එම පද ද්වයම යෙදෙන්නේ ආගමික ව්‍යංගාර්ථයකින් යුතුව ගෞරවාර්ථ පදයක් ලෙස විනා දේශපාලන අර්ථයකින් නොවන බවට ගුණවර්ධන තර්ක කරයි (ගුණවර්ධන 2007.76). මේ පිළිබඳ තවදුරටත් විග්‍රහ කරන ඔහු 'අය' යන්න 'ආර්ය' යන සංස්කෘත වචනයෙන් නොව දෙමළ 'අය්ය' යන පදයෙන් හා 'අඉ' යන පදයන්ගෙන් බව පවසයි. දෙමළ භාෂාවේ මෙම පද යොදා තිබෙන්නේ 'ස්වාමියා' හා 'ප්‍රධානියා' යන අර්ථයෙනි. එහෙයින් 'අය' යන්න දෙමළ භාෂාවෙන් බිඳී වීත් 'රඣ' හා 'ගමණි' යන අර්ථයන්ට සමාන පදවි නාමයක් වීමට ඉඩ ඇති බවත් ඒ අනුව ඔවුන් පූර්ව රාජ්‍ය පාලන රූපවල ආධිපත්‍ය දරූ පිරිසක් වන්නට ඇති බවත් කියා සිටියි (එම 97). ඒ අනුව යථොක්ත ප්‍රදේශයේ අය යන තනතුර දරූ පරම්පරාව එම ප්‍රදේශය පාලනය කළ ප්‍රාදේශීය පාලක පිරිසක් බව ගුණවර්ධන අදහස් කරයි (එම 114)

ප්‍රදේශයේ හමු වූ සෙල්ලිපි අතරින් තත්කාලීන ආගමික තොරතුරු පිළිබඳ ඉතා වැදගත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරයි. මුල් කාලීන සමාජයේ ආගමික ව්‍යූහය සැදුම්ලත් භික්ෂු- භික්ෂුණී, උපාසක-උපාසිකා යන සිව්වනක් පිරිසෙන් භික්ෂු හා උපාසක යන දෙපිරිස පිළිබඳ සෙල්ලිපිවල සඳහන් කරයි. සෙල්ලිපි අතර බෞද්ධ භික්ෂූන් ගැන සඳහන් ලිපි හතරක් හා උපාසකවරු දෙදෙනෙක් පිළිබඳ සඳහන් කරයි. ගවේශන කලාපයේ හමු වූ සෙල්ලිපි අතර ඇතැම් භික්ෂූන්වහන්සේලා හැඳින්වීම සඳහා 'තෙර' යන්නත් ඇතැම් තැන්හි 'බත' යන්නත් යොදා තිබේ. තත්කාලීන සෙල්ලිපි අතර යෙදී ඇති 'බත' යන්න සඳහා විවිධ අර්ථකතන ඉදිරිපත් වී තිබේ. ලංකාවේ සෙල්ලිපි අතර යෙදී ඇති 'බත' යන්නෙන් 'කම්කරුවා' යන අදහස ගම්‍යවන බව පාකර් අදහස් කරයි. 'බත' යන වචනය සංස්කෘතයේ සහෝදරයා යන අදහසින් යෙදී ඇති 'භෘත' යන්නෙන් සැදුන බව වික්‍රමසිංහ අදහස් කරයි (Wickremasingha 1912.141). පරණවිතාන මේ සම්බන්ධයෙන් දරන අදහස වන්නේ එය සංස්කෘතයේ 'භදන්ත' යන පදයෙන් සකස් වූ බවයි. එයින් ගෞරවාර්ථයක් හැගවේ. නමුත් ගවේශන කලාපය තුළ මෙන්ම ලංකාවේ හමුවන ස්ථාන කිහිපයක සෙල්ලිපිවල 'බත' යන පදය යෙදී ඇති ස්ථානය අනුව එම අදහස් නැවත සලකා බැලිය යුතු වෙයි.

ශ්‍රී ලංකාවේ සෙල්ලිපිවල ඇති 'බත' යන පදය භික්ෂූන්වහන්සේලා සඳහා ගෞරවාර්තයෙන් යොදන්නේ නම් උන්වහන්සේලාගේ නම් ලිපියේ මුලින් යෙදිය යුතුය. නමුත් හමු වූ සෙල්ලිපි අතර අංක 1 දරණ ලිපියේත් අංක 11 දරණ ලිපියේත් එය යෙදී ඇත්තේ ලිපිය අවසානයෙහිය. අංක 1 දරණ ලිපියෙන් පැහැදිලි වන්නේ බත යනුවෙන් හැඳින් වූ පුද්ගලයා 'පරුමක'වරුන්ට වඩා පහළ සමාජ තත්වයක් ඉසුලූ බවයි. එසේමකරඹ තැන්නගුහා ලිපියේ රජකෙනෙකු 'බත' යන අභිධානයෙන් හඳුන්වා තිබේ. මෙහි සඳහන් මහතිශ රජු වට්ටගාමිණී රජතුමාගේ

ඥාතී පුත්‍රයා වන මහාචූලික මහාතිස්ස රජු වශයෙන් වික්‍රමසිංහ සූරීන් හඳුනා ගනී (Wickremasingha 1912.146). ආඩියාකන්ද සෙල්ලිපිවල එකම පුද්ගලයා 'බත' හා 'පරුමක' යනුවෙන් හඳුන්වා දී තිබෙයි (ibid 145). එමෙන්ම 'වසභ' රජු ද 'බත' යනුවෙන් හැඳින්වූ බවට සාධක තිබේ (JRAS (CB). NS voi II. 132). ඇතැම් විට මෙම 'බත' යනුවෙන් හැඳින්වූ පුද්ගලයන් ලංකාවේ වෛශ්‍ය කුලයට අයත් වූ පිරිසක් වන්නට ඇති බව ඇතැම් විද්වත්තු අදහස් කරයි (එල්ලාවල 2002.39).

ප්‍රස්තුත ප්‍රදේශයේ ජනයා තුළ පැවති ධර්මාවබෝධ ශක්තිය සෙල්ලිපි වල යොදා ඇති 'පටිබත, අපරිමිත 'ලොකදතුය' වැනි බෞද්ධ දර්ශනයේ ගැඹුරු යෙදීම් තුළින් පැහැදිලි වෙයි. භික්ෂූන් විශයෙහි ලෙන් පූජා කිරීමේ දී එම ස්ථානයට ගැලපෙන්නා වූ ආකාරයෙන් එම ලෙන් නම් කිරීමට ඔවුන් පෙළඹී ඇත. 'මනපදශන' වැනි නම් වලින් හඳුන්වා ඇති ලෙන් අවට පිහිටි ස්වභාවධර්මයේ මනස්කාන්ත බව එදා මෙන්ම අදටත් ඉතා අපූර්ව ආකාරයෙනි දක ගත හැකිය. ඉහත සඳහන් කරන ලද අංක 7 හා 12 යන සෙල්ලිපි දෙකම එකම ගුහාවක ඇතුළත් වී තිබීම මෙහි දී ඉතා වැදගත් සාධකයකි. මීටර 25 පමණ විශාලත්වයෙන් යුතු ලෙන සෑදී ඇත්තේ ගුහාවේ පියස්ස ඉදිරියෙන් ඇති විශාල ප්‍රමාණයේ ගල් කුලකට සම්බන්ධ වීමෙනි. එම ස්භාවික ගල් කුල මුදුනත සමතලා බවින් යුතු වන අතර එය 20×30 පමණ වපසරියකින් යුක්තය. මෙම ස්ථානය භාවනායෝගී භික්ෂූන්වහන්සේලා අද මෙන්ම අතීතයෙත් යොදාගන්නට ඇත. මෙම ගුහාව භික්ෂූන්වහන්සේලා සඳහා පූජා කිරීමේ දී එය කොටස් දෙකකට බෙදා පූජා කළ බව එම ගුහාවේ දක්වෙන සෙල්ලිපි ද්වයෙන් පැහැදිලිය. එකම පුද්ගලයකු විසින් සටහන් කරන ලද මෙම සෙල්ලිපි දෙකෙන් ම කියා සිටින්නේ මෙය සංඝයා විෂයෙහි පූජා කළ බවයි. නමුත් සෙල්ලිපි දෙකෙහි ගුහාව හඳුන්වා තිබෙන නාමයන් වෙනස්ය. එහි ස්වභාව සෞන්දර්ය මනාව දර්ශනය වන කොටස 'මනපදශනෙ' යනුවෙන් නම් කරමින් පූජා කර ඇති අතර ගුහාවේ විශාල ඉඩකඩකින් යුත් අනෙක් කොටස 'ශුපදිනෙ' (මනාව පිහිටි) යනුවෙන් නම් කර ඇත. ඇතැම් විට මෙම සුවිශාල ලෙන් ආරාමය කුටි දෙකක් වශයෙන් වෙන් කරමින් පූජා කරන්නට ඇතැයි සිතීමට හැකියාව ලැබේ. මෙයින් පැහැදිලි වන්නේ දායකයන් විසින් භික්ෂූන්වහන්සේලා සඳහා ලෙන් පූජා කරන විට එහි පිහිටීම කෙරෙහි ද අවධානය යොමු කළ බවයි.

ඒ අනුව ගවේශිත ප්‍රදේශයෙන් හඳුනාගත් සෙල්ලිපිවලින් ප්‍රදේශයේ දේශපාලණික, ආගමික හා සමාජ ඉතිහාසය පිළිබඳ ප්‍රාමාණික දනුමක් ලබා ගැනීමට හැකිවනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


එල්ලාවල, එච්., 2002. **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය.** කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ගුණවර්ධන, ආර්. ඒ. එල්. එච්., 2007. ***'රාජ්‍යයට පූර්විකාවක්'.*** උරුමයක ආවර්ජනා. i භාගය. ආර්. ඒ. එල්. එච් ගුණවර්ධන ඇතුළු තවත් අය (සංස්). පි.91-135. කොළඹ 10: මධ්‍යම සංස්කෘතික අරමුදල.

ඥානවිමල හිමි, කේ., 1967. **සපරගමු දර්ශන.** කතෘ ප්‍රකාශන

මුදියන්සේ, එන්., 2000. **සිංහල ශිලා ලේඛන සංග්‍රහය.** කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මෙධානන්ද හිමි, එල්., 1999. **අප්‍රකට බ්‍රාහ්මී ලෙන් ලිපි.** කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ශ්‍රී සුමංගල හිමි, එච්. හා තවත් අය (සංස්), 1996. **මහාවංශය.** ප්‍රථම භාගය. කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

Paranavitana, S., 1970. **Inscription of Ceylon**. Volume I. Ceylon: Department of Archaeology.

Parker, H., 1909. London: Ancient Ceylon.

Somadeva, R., A. Wanninayaka, D. Devage., 2015. Kaltota Survey – Phase I. Memoirs of the P§tgraduate Institute of Archaeology. (ed) J. Weerasingha. Colombo 7. PGIAR Publication.

Wickremasingha, D. M. D. Z., 1912. *Epigraphia Zeylanica.* Vol. I. London: Oxford University press.